රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

N-177

## 01. ඉවතලන අස්කොන් කඩදාසි (සුදු හා මිශ්‍ර)
## 02. භාවිතා කළ මුද්‍රණ තහඩු
## 03. භාවිතා කළ මුද්‍රණ තහඩු උණු කිරීම පිණිස

## විකිණීම සඳහා මිල ගණන් කැඳවීම

2020 වර්ෂය සඳහා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ භාවිතයෙන් ඉවත් කළ අස්කොන් කඩදාසි, භාවිතා කළ මුද්‍රණ තහඩු විකිණීමට සහ භාවිතා කළ මුද්‍රණ තහඩු උණු කිරීම පිණිස විකිණීමට රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් මුද්‍රා තබන ලද මිල ගණන් කැඳවනු ලැබේ. මෙහිදී භාවිතයෙන් ඉවත් කළ අස්කොන් කඩදාසි සඳහා මිල ගණන් ඉදිරිපත් කළ හැකිවන්නේ අදාළ ක්ෂේත්‍රයේ වසර 05 ක පළපුරුද්දක් සහිත ලංසුකරුවන්ට පමණක් වේ. (පළපුරුද්ද ලේඛන මඟින් සනාථ කළ යුතු ය.)

**විකුණුම් ද්‍රව්‍ය :**
(01) ඉවතලන කඩදාසි අස්කොන් (සුදු හා මිශ්‍ර) - DGP/OS/COMMON/2020
(02) භාවිතා කළ මුද්‍රණ තහඩු - DGP/OS/PLATE DISPOSAL/2020
(03) භාවිතා කළ මුද්‍රණ තහඩු උණු කිරීම පිණිස - DGP/OS/PLATE CONFIDENTIAL/2020

එක් එක් කාර්යය සඳහා වන අයදුම්පත් 2019.11.29 දින සිට 2019.12.13 දින ප.ව.3.00 දක්වා සතියේ දිනවල රාජකාරී වේලාව තුළ දී එක් අයදුම්පතකට රුපියල් 250.00ක ගාස්තුවක් බැගින් ගෙවීමෙන් රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ ප්‍රවාහන අංශයෙන් ලබා ගත හැක.

සියලුම අයදුම්පත් 2019.12.13 දින ප.ව.2.00 ට පෙර ලියාපදිංචි තැපැල් මඟින් එවීම හෝ දෙපාර්තමේන්තුවේ ප්‍රවාහන අංශයේ තබා ඇති ලංසු පෙට්ටියට බහාලීම හෝ කළ හැකි ය.
2019.12.13 දින ප.ව.2.00 ට යථෝක්ත කාර්යයන් තුනටම අදාළ ලංසු විවෘත කරනු ලැබේ.

අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ලංසුකරු විසින් මිල ගණන් ඉදිරිපත් කරන කාර්යය අනුව **"ඉවතලන කඩදාසි අස්කොන් (සුදු හා මිශ්‍ර) මිලදී ගැනීම "** හෝ **"භාවිතා කළ මුද්‍රණ තහඩු මිලදී ගැනීම"** හෝ **"භාවිතා කළ මුද්‍රණ තහඩු උණු කිරීම සඳහා මිලදී ගැනීම"** යනුවෙන් සඳහන් කළ යුතු ය.

ඉහත එක් එක් කාර්යය වෙනුවෙන් තැන්පත් කළ යුතු ලංසු බැඳුම්කරයේ වටිනාකම පහත පරිදි වන අතර එම ලංසු බැඳුම්කරය මුදලින් රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව වෙත තැන්පත් කර අදාළ කුවිතාන්සියේ මුල් පිටපත නියමිත ලංසුව සමඟ අමුණා ඉදිරිපත් කළ යුතු ය.

| කාර්යය | ලංසු බැඳුම්කරයේ වටිනාකම |
|---|---|
| 01. ඉවතලන කඩදාසි අස්කොන් (සුදු හා මිශ්‍ර) | රු: 150,000.00 |
| 02. භාවිතා කළ මුද්‍රණ තහඩු | රු: 25,000.00 |
| 03. භාවිතා කළ මුද්‍රණ තහඩු උණු කිරීම පිණිස | රු: 25,000.00 |

ඉහත කාර්යයන් සම්බන්ධව වැඩි විස්තර සතියේ වැඩ කරන දිනයන් හි පෙ.ව.8.30 සිට ප.ව.4.15 දක්වා දුරකථන අංක 0112694656 සහකාර රජයේ මුද්‍රණාලයාධිපති (ආයතන) ඇමතීම මගින් ලබා ගත හැක.

ගංගානි ලියනගේ,
සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව.

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
අංක 118, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත,
කොළඹ 08.
2019/ 11/29
දුරකථන - 0112694656
ෆැක්ස් - 0112698653
වෙබ් අඩවිය - www.documents.gov.lk